## හම්බන්තොට දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීම - 2026.06.04

ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, රාජ්‍ය නිලධාරීන්ගේ හා ධීවර කාර්මිකයින්ගේ සහභාගීත්වයෙන් 2026.06.04 දින පෙ.ව.9.00ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි. පැමිණ සිටි නිලධාරීන් පැමිණීමේ ලේඛනය පරිදි වේ.

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවත්වනු ලබන දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දෙවන සැසිවාරය සඳහා සහභාගී වූ ධීවර, ජලජ හා සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා සහ දේශපාලන නායකත්වය හා සියලුම නිලධාරීන් දිස්ත්‍රික් ලේකම්තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව ධීවරයින්ගේ ගැටළු විසඳීම සඳහා මෙවැනි රැස්වීමක් සංවිධානය කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් රැස්වීමේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමාට අවස්ථාව ලබාදෙන ලදි.

ඉන්පසු ධීවර, ජලජ හා සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා විසින් රැස්වීමේ අරමුණ පැහැදිලි කරමින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යාපෘති පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමත්, රාජ්‍ය නිලධාරීන්ට බාධාවක් නොවන ලෙසට ප්‍රගතිය සමාලෝචනය කිරීම මෙම කමිටුවේ අරමුණක් බව ප්‍රකාශ කරන ලදි.තවද මෙම වසර ඇතුලත රටේ ධීවර කර්මාන්තය ගමන් කළ යුතු දිශානතිය හා ඒ සඳහා ක්‍රියාත්මක කිරීමට අදාල සැලසුම් සකස් කර ඇතිකළ අතර එය අධියර 05කට අදාලව ක්‍රියාත්මක වන බවත් හඳුන්වා දෙන ලදි. එමෙන්ම වර්තමානයේදී ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව මුහුද දෙමින් සිටින අභියෝග හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම කඩිනම් කිරීමේ අවශ්‍යතාවයත් එම විසඳුම් සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනවල සහයෝගය අත්‍යාවශ්‍ය බැවින්, එම සහයෝගය ලබා ගැනීමේ පහසු ඒකකයක් ලෙස මෙම කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු සංවිධානය කළ බව ප්‍රකාශ කරන ලදි. එම කමිටුව මාස 6කට වරක් පවත්වා ප්‍රගතිය ලබා ගැනීමට සුදුසු බව සඳහන් කරන ලදි. රටේ ජාතික ආර්ථිකට වැඩි දායකත්වයක් සපයන ධීවර කර්මාන්තය නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කිරීමට දායකකර ගැනීම මෙහි අපේක්ෂාව බව සඳහන් කරන ලදි. තවද 2029 දක්වා ක්‍රියාත්මක කිරීමට අදාලව අමාත්‍යාංශය මගින් කුඩාවැල්ල වරායට රු.මි 1700 ක්, තංගල්ල වරායට රු.මි. 565ක්, කළමැටිය වරායට රු.මි 303 ක් , හම්බන්තොට වරායට රු.මි.171 සහ කිරින්ද වරායද ඇතුලත්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර වරායන් සංවර්ධනයට රු.මි 2839 ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, එම ප්‍රතිපාදනවල මූලික සැලැස්මක් තම අමාත්‍යාංශය සතු බවත්, ඒ අනුව මෙම දිස්ත්‍රික්කය වෙත 2026 වර්ෂය වෙනුවෙන් මේ වන විට රු.මි 72.5 ක මුදලක් වෙන් කර ඇති බවත්, එහි වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම මෙම මූලික එක් අරමුණක් බවත්ප්‍රකාශ කරන ලදි.මීට අමතරව මෙම වර්ෂය සඳහා රු.මි.2.5ක් විසිතුරු මත්ස්‍ය වගාව සඳහා ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.

ඉන්පසු අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් පසුගිය රැස්වීම් වාර්තාව සභාව වෙත ඉදිරිපත් කළ අතර නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් සභා සම්මත විය. පසුව රැස්වීම් වාර්තාවේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කළ අතර ප්‍රගතිය වෙත තවත් එකතු කළ යුතු කරුණු තිබේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි. තවද ගැටලු සඳහා උපරිම සහයෝගය තම අමාත්‍යාංශය මගින් ලබාදෙන බවත් පැහැදිලි කරමින් ආයතනවලින් ලබාගත් ගැටලු සාකච්ඡාවට ගත් අතර, එහිදී සාකච්ඡා වූ කරුණු පහත පරිදි වේ.

| අ.අ. | ගැටළුව | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | පල්ලික්කුඩාව ග්‍රාමයේ රාත්‍රී කාලයේ පොකිරිස්සන් ඇල්ලීම සඳහා මුහුදට බසින ධීවරයින් බිත්තර සහිත පොකිරිස්සන් ඇල්ලීම නිසා පොකිරිස්සන් වඳ වී යාම | පෙබරවාරි, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් යන කාලවලදී පොකිරිස්සන් ඇල්ලීම තහනම් කර තිබියදීත් ධීවරයින් එම ක්‍රියාවේ යෙදෙන බවට කරුණු ඉදිරිපත් විය. තවද මේ වන විට වැටලීම් 15 පමණ සිදු කර ඇති බවත් පැමිණිලි 10ක් ගොනු කර ඇති බවටත්, මේ සඳහා ධීවරයින් යොමු වීමේ පැහැදිලි අඩු වීමක් දක්නට ලැබෙන බවට සාකච්ඡා විය. තවද අමාත්‍යාංශ මට්ටමින් වැටලීම් ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු සූදානම් කරමින් පවතින බවටද වැඩි දුරටත් සාකච්ඡා විය. | මේ සම්බන්ධයෙන් ධීවර ප්‍රජාව දැනුවත් කළ යුතු බවත්, නාවික හමුදාවට සහ පොලිසියට අදාළ නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් ඒ සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වෙරළ ආරක්ෂණ අධිකාරිය සම්බන්ධ කර ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br><br>නාවික හමුදාව, තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>අධ්‍යක්ෂ ජනරාල්, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව |
| 02. | ජූල්ගහවැල්ල නුගේ වැල්ලේ තිබූ සූර්ය පැනල දෙක ඉවත් කිරීම | මුහුදු ඛාදනය හේතුවෙන් ගැලවී ඇති බව සාකච්ඡා විය. එහි සූර්යය පැනල දෙක නැවත සවිකිරීමට පෙර රැස්වීමේදී තීරණය වූ අතර තවමත් මෙය සවි කර නොමැති බවට සාකච්ඡා විය | එහි සූර්යය පැනල දෙක නැවත සවිකිරීමට තීරණය විය | ලේකම්, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය |
| 03. | කුඩාවැල්ල ප්‍රදේශයේ උම්බලකඩ නිෂ්පාදනයේදී මාළු තම්බන වතුර නිසි පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම. | මේ සම්බන්ධයෙන් අදාල සියලු පාර්ශව සම්බන්ධ කර ගනිමින් රැස්වීමක් පැවැත්වූ බවටත් එම ගැටලුව විසඳා ගැනීම සඳහා නාරා ආයතනය මගින් සකසන ලද ව්‍යාපෘති වාර්තාව සඳහා ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන වෙතින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බවට සාකච්ඡා විය.<br>මාළු අපද්‍රව්‍ය ඉවත් කරන ජලයෙන් බයෝ ගෑස් පද්ධතිය ස්ථාපිත කිරීමට හැකියාවක් නොමැති බවට සාකච්ඡා විය.<br>මෙම අපජලය ටින් මාළු කර්මාන්තශාලා වලින් එකතුවන අපජලය හා එක් කර භාවිතා කිරීම සඳහා එහි ඇමයිනෝඅම්ල වලට අදාල පරීක්ෂණය සිදු කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය.<br><br>මෙම අපද්‍රව්‍ය සඳහා පිළියමක් සකස් කිරීමේ හැකියාව පිළිබඳ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විද්‍යා නිලධාරී සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කිරීම සුදුසු බවට වැඩි දුරටත් සාකච්ඡා විය. | කඩිනමින් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන වෙතින් මුදල් වෙන්කරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම්<br><br>ප්‍රාදේශීය ලේකම්, තංගල්ල<br><br>සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන ය<br><br>සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br><br>අධ්‍යක්ෂ ජනරාල්, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව |

| | | | | |
|---|---|---|---|---|
| 04. | උණාකුරුව වෙරළේ විශාල ලෙස ප්ලාස්ටික් පොලිතින් අපද්‍රව්‍ය ඒකරාශි වීම | ධීවර කාර්මිකයින් සහ වෙරළට පැමිණෙන සංචාරකයින් විසින් රැගෙන යන පොලිතින් ඇතුළු ප්ලාස්ටික් අපද්‍රව්‍ය හේතුවෙන් වෙරළට ප්ලාස්ටික් අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් එකතු වන බව සාකච්ඡා විය.<br><br>තවද, ධීවර වරාය නීතිගත සංස්ථාව මගින් ජලය ගෙන යාම සඳහා ලී.5 හෝ ඊට ඉහළ ප්‍රමාණයේ කෑන් භාවිතා කිරීම සඳහා ධීවරයින්ට උපදෙස් ලබා දී ඇති බවත්, ඒවා නිසි අධීක්ෂණයට ලක් විය යුතු බවත් පැහැදිලි කරන ලදී. | මේ පිළිබඳව ධීවරයින් දැනුවත් කිරීමටත් තීරණය වූ අතර, ධීවරයින් මුහුදු යන විට රැගෙන යන බඩු නිරීක්ෂණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලෙසට වරාය කළමණාකරු වෙත උපදෙස් ලබා දුනි. තවද මේ සඳහා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද හා අනෙකුත් අවශ්‍ය නිලධාරීන්ද සම්බන්ධ කර ගැනීමට තීරණය විය | අධ්‍යක්ෂ ජනරාල්, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>වරාය කළමණාකරුවන් , තංගල්ල, කුඩාවැල්ල, කළමැටිය, හම්බන්තොට කිරින්ද |
| 05. | වැල්ලෝඩය මා දැල් නොවුපල තිබෙන ස්ථානය අඳුරේ පැවතීම | වැල්ලෝඩය ධීවර වරාය තිබෙන ස්ථානය අඳුරු ස්වභාවයක් ගැනීම නිසා ගැටළු රැසක් මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br><br>එබැවින් මේ සඳහා විදුලි පහන් සවි කිරීම සිදු කළ යුතු බැවින් ප්‍රධාන විදුලි සම්බන්ධතාවයෙන් හෝ සූර්යබල පහන් සවි කිරීම සුදුසු බවට සාකච්ඡා විය. | වැල්ලෝඩය ධීවර වරාය භූමියෙහි සුදුසු පරිදි පහන් සවිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, තංගල්ල<br><br>වරාය කළමණාකරු, තංගල්ල |
| 06. | වැල්ලෝඩය මාදැල් වරායට පිවිසෙන මාර්ගය ඉතා පටු බැවින් වරායට යාම සඳහා ධීවරයින්ට අපහසු තත්වයක් ඇති වීම | මාර්ගය අඩි 12 පාරක් විය යුතු බවත්, මාර්ගය පුළුල් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු බව ප්‍රකාශ කළ අතර පැරණි ගම් සැලැස්මේ අඩි 12 පාරක් පැවති බවට සාකච්ඡා විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවටත් ඉදිරි මාස 03ක් ඇතුලත මෙහි ප්‍රගතියක් ලබා ගත යුතු බවටද තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>වරාය කළමණාකරු, තංගල්ල |
| 07. | වැල්ලෝඩය බයිසිකල් මගින් මාළු වෙළඳාම යන අයට වෙළඳාම් කටයුතු සඳහා බාස්කට් භාවිතා කරන බවත් එසේ වෙලඳාම් කිරීමේදී ධීවරයින් අපහසුතාවයට පත් වීම. | මාළු වෙළඳාම් කරන පුද්ගලයින් සඳහා මාළු පෙට්ටි ලබා දීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | වැල්ලෝඩය ධීවරයින් වෙත මාළු පෙට්ටි ලබා දීම දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටුවේදී අනුමත වූ බවත් මාළු පෙට්ටි අවශ්‍ය ධීවරයින්ගේ ලේඛනයක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් වෙත ලබා දීමට කටයුතු කරන ලෙස වැල්ලෝඩය ධීවර සමිති දැනුවත් කරන ලෙසත් දැනුම් දෙන ලදී. | ලේකම්, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>ධීවර පරීක්ෂක, තංගල්ල |

| | | | | |
|---|---|---|---|---|
| 08. | පරප්පුව වැව සංචාරක හා ධීවර කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණය කිරීම | මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත තංගල්ල ප්‍රාදේශීය ලේකම් විසින් යොමු කර ඇති නමුත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ප්‍රමාද වන බව ප්‍රකාශ විය. එබැවින් මෙය වාරිමාර් හෝ පළාත් වාරිමාර්ග වෙතින් සිදු කරවා ගැනීම සුදුසු බවට සාකච්ඡා විය. | මෙම වැව ප්‍රතිසංස්කරණය සඳහා දකුණු පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් මගින් සිදු කරවා ගැනීමට ඉල්ලීමක් කිරීමට තීරණය විය. | ලේකම් ,දකුණු පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට |
| 09. | උඩුකිරිවිල වැව, දෙබර වැව සහ ඕලුවිල වැවේ ජලජ ශාක බහුල වීම නිසා ධීවර කටයුතු සිදු කිරීමට අපහසු වීම හා එම ශාක හේතුවෙන් දැල් ආම්පන්න විනාශ වීම. | ඕලුවිල වැව සඳහා ප්‍රජාශක්ති වැඩසටහන මගින් ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබෙන බවත්, දෙබරවැව රු.මි.2.4 මුදලක් වියදම් කර 50% පමණ ප්‍රමාණයක ජලා ශාක ඉවත් කර තිබෙන බවත්, උඩුකිරිවල වැව සඳහා දැනට රු.මි.98 ඇස්තමේන්තුවක් සකස් කර තිබෙන බවත් නැවත නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස් කිරීම සිදු කළ යුතු බවතටත් සාකච්ඡා විය.<br><br>තවද ජලජ ශාක ඉවත් කිරීමේදී නැවත වේගයෙන් ව්‍යාප්ත වන බවත් ඒ සඳහා විශේෂ හේතුවක් පවතීද යන්න පිළිබවද සොයා බැලිය යුතු බව සාකච්ඡා විය. | උඩුකිරිවල වැව සඳහා නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස් කර ධීවර අමාත්‍යාංශය වෙත යොමු කරීමට කටයුතු කරන ලෙසත්, ජලජ ශාක වේගයෙන් ව්‍යාප්ත වීම කෙරෙහි ජලයේ හෝ වෙනත් සාධකයක් පවතින්නේද යන්න වාරිමාර්ග , නාරා ආයතනය ජලජීවී ආයතනය එක්ව මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් යොමු කරන ලෙසත් දැනුම් දෙන ලදි. | වාරිමාර්ග අධ්‍යක්ෂ, හම්බන්තොට<br><br>සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන ය<br><br>දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී. (NAQDA) |
| 10. | ස්වභාවික ව්‍යසනවලදී ධීවරයින්ට සිදුවන හානි ප්‍රතිපූර්ණය සඳහා ක්‍රමවේදයක් නොමැතිවීම. | කෘෂි රක්ෂණ මණ්ඩලය වෙතින් කරදිය හා මිරිදිය ධීවරයින් රක්ෂණය සිදු කිරීම ආරම්භ කර තිබෙන බවත්, වයස අවු: 18-65 අතර සඳහා පූර්ණ හා අකර්මර්ණ තාවයන් සඳහා ගෙවීම් සිදු කරන බවට සාකච්ඡා විය.<br><br>තවද ධීවර පරීක්ෂකවරු සම්බන්ධ කරගෙන විශ්‍රාම වැටුප් ක්‍රමයට ධීවරයින් සම්බන් කර ගැනීම සුදුසු බවටද යෝජනා විය.<br><br>ධීවර බෝට්ටු වලට සිදු වන හානි ආවරණය කිරීම සඳහා රක්ෂණ ක්‍රමයක් නොමැති බවත්, සමූපකාර රක්ෂණ ක්‍රමය මගින් පමණක් ධීවර බොට්ටු රක්ෂණය සිදු කරන අතර පූර්ණ වශයෙන් හානි වුවහොනත් පමණක් ගෙවීම් සිදු කරන බවට සාකච්ඡා විය. | NAQDA ආයතනයේ නිලධාරීන් හා ධීවර පරීක්ෂකවරු සම්බන්ධ කරගනිමින් ධීවරයින් රක්ෂණය කිරීමටත් සහ ඔවුන් ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයට සම්බන්ධ කර ගන්නා ලෙසත් දැනුම් දෙන ලදි.<br><br>මෙහිදි ධීවර ආම්පන්න රක්ෂණය කිරීමට නොහැකි බවත් ජීවිත හා යාන්ත්‍ර පමණක් රක්ෂණය කළ හැකි බවත් දැනුම් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය<br><br>දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී. (NAQDA)<br><br>ධීවර පරීක්ෂකවරු |

| | | | | |
|---|---|---|---|---|
| 11. | ධීවර පවුල් වල සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පැවතීම | ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල්වල සාමාජිකයින් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම ප්‍රධාන ගැටලුවක් බවට කරුණු ඉදිරිපත් විය. 2027 වර්ෂයේ දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය මගින් සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බවත් ප්‍රතිපාදන සීමිත බැවින් විවිධ අමාත්‍යාංශ මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන වෙන් වන බැවින් ඒවා උපයෝගී කරගනිමින් සනීපාරක්ෂක පහසුකම් අඩු ධීවර පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම සුදුසු බවට සාකච්ඡා විය. | සනීපාරක්ෂක පහසුකම් නොමැති ධීවර පවුල් පිළිබඳ ධීවර පරීක්ෂකවරු වෙතින් ලබාගෙන ප්‍රාදේශීය ලේකම්වරු වෙත හා ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටු සභාපති වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී, (NAQDA)<br><br>ධීවර පරීක්ෂකවරු. |
| 12. | පල්ලෙමලල මලල කලපුව හා ඇඹිලිකළ කලපුව වැසි ජලයෙන් පිරෙන විට උඩමලල යාය යටවන බැවින් මෝය කට කැපීම. | මේ පිළිබඳ අධ්‍යනයක් සිදු කළ බවත්, මෝය කට කැපීම හේතුවෙන් කලපුවේ මාළුන් මුහුදට ගසාගෙන යන බවින් මෝය කට කැපීමට ධීවරයින් විරුද්ධ බැවින් එහි ස්පිල් එක දික් කිරීම යුදුසු බවට සාකච්ඡා විය. | එහි ස්පිල් එක දික් කිරීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැන්වීය. | වාරිමාර්ග අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 13. | තිස්ස වැවේ එංජින් බෝට්ටු භාවිතය. | සංචාරක කටයුතු සඳහා එංජින් බෝට්ටු 15ක් දැනට භාවිතය නිසා ධීවර කටයුතු සඳහා බාධා පැමිණ ඇති බවටත්, එය ජල ජීවීන්ටත් ශාක වලටත් හානිකර තත්තවයක් ගෙන දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය ලේකම්,රුහුණු සංචාරක කාර්යාංශය, NAQDA ආයතනය එක්ව බොට්ටු හිමියන් ගෙන්වා මේ පිළිබඳ සාකච්ඡා කර පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් ගොඩනැගීම කෙරෙහි එකගතාවයක් ඇති කර ගැනීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාම<br><br>සභාපති, රුහුණු සංචාරක කාර්යාංශය,<br><br>දිස්ත්‍රික් ජලජීවී, ව්‍යාප්ති නිලධාරී, (NAQDA) |
| 14. | තිස්සමහාරාම ප්‍රදේශයේ (යාල හන්දියේ) පිහිටි බෝට්ටු අංගනය එක් ව්‍යාපාරිකයෙකු විසින් පවත්වා ගෙන යාම . | තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම 03හි දීමනාපත්‍ර අවලංගු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත උපදෙස් ඉල්ලා ලිපියක් යොමු ඇති බව දන්වා සිටින ලදී. | විශේෂ කටයුත්තක් ලෙස සලකා බලා මෙය මාස තුනක් ඇතුළත මෙම ඉඩම නිදහස් කර දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, තිස්සමහාරාම |
| 15. | තංගල්ල හා කුඩාවැල්ල ධීවර වරායන් හා ඉන්ධන පිරිවුම්හල් අතර ඇති දුර ප්‍රමාණය වැඩි වීම හා අවශ්‍ය භූමිතෙල් ප්‍රමාණය සපයා ගැනීමේ දුෂ්කරතාවය. | තංගල්ල කුඩාවැල්ල ධීවර වරාය ආශ්‍රිතව පවතින පිරවුම්හල් අතර ඇති දුර ප්‍රමාණය වැඩි වීම නිසා ඉන්ධන ගෙන යාමට හා ඒමට අධික පිරිවැයක් දැරීමට සිදු වීම එම වරායන් ආශ්‍රිතව එක් දින හා බහු දින යාත්‍රා විශාල ප්‍රමාණයක් ඇති බැවින් ධීවර සමිතියක් වෙත වගකීම ලබා දී වරාය ආශ්‍රිත නිවයක භූමි තෙල් පිරිවුම්හලක් ස්ථාපිත කිරීම. | ධීවර දෙපාර්තමේන්තුව වෙතින් දෛනික අවශ්‍යතාවය හදුනාගෙන ධීවර අමාත්‍යාංශය තුළ බලශක්ති අමාත්‍යාං,ශය ධීවර වරාය නීතිගත සංස්ථාව, පොලිසිය එක්ව ශක්‍යතා වාර්තාවක් ගෙන භූමිතෙල් පිරිවුම්හල් ලබා දීමේ අවශ්‍යතාවය පිළබඳව තීරණය කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, ධීවර අමාත්‍යාංශ<br><br>අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |

| | | | | |
|---|---|---|---|---|
| 16. | කුඩාවැල්ල ධීවර වරායේ ධීවර යාත්‍රා මගින් රැගෙන එන මත්ස්‍ය අස්වැන්න වරාය භූමියේ ගොඩබෑම නිසා මසුන්ගේ ගුණාත්මක භාවය අඩු වීම. | ධීවරයින් විසින් රැගෙන එන මත්ස්‍ය අස්වැන්න වරාය භූමායේ ගොඩබෑම නිසා මසුන්ගේ ගුණාත්මකභාවය අඩු වීම හා පොළොව මතුපිට තිබෙන විශබීජ මසුන් තුලට ඇතුල් වීම නිසා ගුණාත්මක මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනිමට අපහසු වීම. මෙහිදී මුහුදු ජලය භාවිතා කර මත්සයන් ශේදීම සිදු කරන බවටත්, කරුණු වාර්තා විය. | දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය මගින් 50% දායකත්වය මත පැලට් ලබා දීමට තිරණය විය. මත්ස්‍ය අස්වැන්න සුරක්ෂිතභාවය පරික්ෂා කිරිමට මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් යොදා ගන්නා ලෙසත්, වරායන් සඳහා නළ ජලය ලබා දීමේ හැකියාව සොයා බලන ලෙසටත් දැනුම් දෙන ලදී. | ලේකම්, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශ<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 17. | කුඩාවැල්ල, තංගල්ල, හම්බන්තොට, කිරින්ද වරායන් සඳහා බහුදින ධීවර යාත්‍රා ජලයට මුදා හැරිම සහ ගොඩබීමට ගැනිම සඳහා දොඹකර යන්ත්‍රයක් නොමැති වීම. | මෙම වරායන් තුළ දොඹකර යන්ත්‍රයක් නොමැති වීම නිසා ගාල්ල වැනි දුර වරායන් මගින් දොඹකර යන්ත්‍රයක් රැගෙන එම සඳහා විශාල පිරිවැයක් දැරිමට යාත්‍රා හිමියන්ට සිදු වීම. වරාය නිතිගත සංස්ථාය මගීන් මේ වන විටත් දොඹකර යන්ත්‍ර දෙකක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බවත්, සාකච්ඡා විය. | ප්‍රසම්පාදනය කර ඇති දොඹකර යන්ත්‍ර දෙකෙන් එකක් මෙම දිස්ත්‍රික්කයට ලබා දීමට තීරණය විය. | සභාපති ලංකා වරාය නිතිගත සංස්ථාව |
| 18. | රැකව නැන්ගුරම්පොළට යන මාර්ගය අබලන් තත්ත්වයේ පැවතිම | රැකව නැංගුරම්පොළට යන මාර්ගය අබලන් තත්ත්වයේ පැවතිම නිසා ප්‍රදේශයේ ධීවර ජනතාවට හා මසුන් මිල දී ගන්නා එන පුද්ගලයින් අපහසුතාවයට පත්වන බව සාකච්ඡා විය. | නව මිල ගණන් අනුව ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රජාශක්ති වැඩසටහන යටතේ කි. මී. එකක් කාපට් කර දීමට තීරණය විය. | ප්‍රාදේශිය ලේකම් තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 19. | රැකව ධීවර වරාය සඳහා ධීවර පරික්ෂණ කාර්යාලයක් නොමැති වීම. | රැකව ධීවර වරාය සඳහා ධීවර පරික්ෂණ කාර්යාලයක් නොමැති වීම හේතුවෙන් රාජකාරි කටයුතු සිදු කිරිමට අපහසු වී ඇත. | 2027 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 20. | උස්සන්ගොඩ ධීවර වරායට යන මාර්ගය අබලන් වීම. | උස්සන්ගොඩ ධීවර වරායට යන මාර්ගය අබලන් වීම නිසා ජනතාවට හා මසුන් මිල දී ගන්නා එන පුද්ගලයින් අපහසුතාවයට පත්වන බව සාකච්ඡා විය. | කි.මී.දෙකකට ආසන්න මෙම මාර්ගය සංචාරකයින් විසින් බහුලව භාවිතා කරන මාර්ගයක් බැවින් සහකාර අධ්‍යක්ෂ (ධීවර) මගින් ඇස්තමේන්තු සකස් කර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍ය වෙත පිටපත් සහිතව සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 21. | කහඳමෝදර ධීවර තොටුපලේ ප්‍රජාශාලා 02 පිළිසකර කිරිම. | කහඳමෝදර ධීවර ප්‍රජාශාලා 02 අලබලන් වී ඇති අතර ධීවර ජනතාවගේ ප්‍රයෝජනයට ගැනිමට නොහැකි වී ඇති බව සාකච්ඡා විය. | අබලන් වී ඇති ප්‍රජාශාලා දෙකෙන් අඩි 50 පමණ දිග ප්‍රජාශාලව අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ධීවර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |

| | | | | |
|---|---|---|---|---|
| 22. | වැලිපටන්විල ධීවර නැංගුරම් තොටුපලට ප්‍රජා ශාලාවක් ලබා දීම. | වැලිපටන්විල ධීවර නැංගුරම් තොටුපලට ප්‍රජා ශාලාවක් ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා විය. | මේ සඳහා ඇස්තමේන්තුවක් සකස්කර 2027 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 23. | ලුණම ශූරියගහ වැල්ලට යන මාර්ග සුදුසු පරිදි සංවර්ධන කිරීම. | ලුණම සූරියගහ වැල්ලට යන මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බවට සාකච්ඡා විය. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කර සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 24. | වරායන්හි එකතුවන ෆයිබ ග්ලාස් එකතු කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | වරායන්හි එකතුවන ෆයිබර් ග්ලාස් දිරාපත් නොවන බැවින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවටත්, ෆයිබර් ග්ලාස් ප්‍රතිචක්‍රියකරණය කිරීමේ ව්‍යාපෘතියක් නොවැම්බර් මස අවසානයේ නිම කිරීමට නියමිත බවත් සාකච්ඡා විය.<br><br>තවද වරායන් තුළ ප්ලාස්ටික හා පොලිතීන් අපද්‍රව්‍ය බැහැර කිරීමද ඉහළ මට්ටමක පවතින බවද, අම්බලන්තොට පිහිටි ධීවර වරායන් තුළ මාළු අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලුවක් පවතින බවට සාකච්ඡා විය. | ප්ලාස්ටික හා පොලිතීන් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා පලාත් පාලන ආයතන සම්බන්ධකර ගැනීමට තීරණය විය. | පළාත් පාලන සහකාර කොමසාරිස්. |
| 25. | හම්බන්තොට ධීවර වරාය අසල මාදැල් වාරයක් සඳහා අවසර ලබා ගැනීම. | හම්බනතොට ධීවර වරාය ආශ්‍රිතව වසර 20ක් පමණ කාලයක් තිස්සේ පවත්වාගෙන ගිය මාදැල් තොටුපල වන්දි මුදල් ගෙවා බලපත්‍රය අවලංගු කර ඇති බවට සකච්ඡා විය. එහෙත් බලපත්‍රය අවලංගු කිරීම නිසා අර්ථික සමාජීය ගැටලු රාශියක් උත්ගත වී ඇති බව කරුණු ඉදිරිපත් විය. එබැවින් බලපත්‍රයක් ලබා ගන්නා තෙක් මාදැල් කර්මාන්තයේ නියලීමට තාවකාලික අවසරයක් ලබා දෙන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් විය. | වන්දි මුදල් ගෙවා බලපත්‍රය අවලංගු කර ඇති බැවින් මේ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡාවක් නාරා ආයතනය, අතිරේක ලේකම් ,සංවර්ධන(ධීවර අමාත්‍යාංශය) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව සිදු කිරීමට තීරණය විය. | ලේකම්, ධීවර අමාත්‍යාංශය |
| 26. | තිස්ස කිරින්ද "දොරාව" මාදැල් වරායට මාදැල් වටවාරයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම | 2024ට පෙර සිට මෙම වරාය තුළ එම්.කේ.මහින්දපාල නම් පුද්ගලයා මා දැල් කර්මාතයේ යෙදී ඇති බවත්, දැල් ආම්පන්න ද මා දැල් ඔරුවක් ද මිනිස් ශ්‍රමයන් ඔහු සතු බැවින්, මා දැල් වටවාරයක් ඉල්ලා ඇති බවට සාකච්ඡා විය. | ඒ පිළබඳව සොයා බලා අමාත්‍යාංශය වෙත කරුණු වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල. |

| | | | | |
|---|---|---|---|---|
| 27. | බෙලිඅත්ත ලංකා ධීවර සංස්ථා අලෙවිසැල ආරම්භ කිරීම. | බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු බෙලිඅත්ත නගරයේ ඇති කඩ කාමරයක් ලංකා ධීවර සංස්ථාව විසින් අලුත්වැඩියා කර ඇත. මෙම කඩ කාමරය අලුත්වැඩියාව සඳහා වැය වූ මුදල කඩ කාමරයේ කුලියෙන් අඩු කරන ලෙස ඉල්ලීම් කළ අතර එය සේ අඩු කිරීමට ප්‍රාදේශීය සභාව එකඟතාවය පලකරන ලදී. | මෙහි ඉදිරි කටයුතු සඳහා ප්‍රගතිය දැනුම් දෙන ලෙස දන්වා සිටින ලදී. | සභාපති, ලංකා ධීවර නීතිගත සංස්ථාව. |
| 28. | මිරිජ්ජවිල ධීවර තොටුපලෙහි ගොඩගැසී ඇති වැලි පරය ඉවත් කිරීම. | මිරිජ්ජවිල ධීවර තොටුපලෙහි ගොඩගැසී ඇති වැලි පරය නිසා ධීවර යාත්‍රා මුහුද වෙත දියත් කිරීමට ගැටලු සහගත වී ඇත. ඒ පිළිබඳ විවිධ ආයතන වෙත දැනුම් දී ඇති මුත් මෙ වන තෙක් වැලිපරය ඉවත් නොකිරීම නිසා ධීවරයින්ට ජීවිකාව කර ගෙන යාමට අපහසු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. වැලි පරය ඉවත් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් අවසරය ලැබී තිබුණ ද මෙහි ඇති ඛනිජ සම්පත් හේතුවෙන් කර්මාන්ත අමාත්‍යාංශය හා ඛනිජ සම්පත් අමාත්‍යාංශ මඟින් මේ වන තෙක් අවසර ලබා නොදීම හේතුවෙන් වැලි පරය ඉවත් කිරීමට නොහැකි වී ඇති බවටත් කරුණු ඉදිරිපති විය. | ඛනිජ සම්පත් අමාත්‍යාංශය හා කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවත්නා තත්ත්වය හා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලමින් ලිපි යොමු කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | සභාපති, ශ්‍රී ලංකා වරාය නීතිගත සංස්ථාව<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල. |
| 29. | හම්බන්තොට වරායේ දැල් ආම්පන්න තබා ගැනීමට ශාලාවක් හා විධිමත් වැසිකිලි පද්ධතියක් නොමැති වීම. | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රධාන වරායේ ආශ්‍රිතව පහසුකම් වැඩි දියුණු කිරීමේ සැලැස්මක් සකස් කර ඇති බවත්, 2029 වර්ෂය වන විට මෙම කටයුතු අවසන් කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | 2026 – 2029 සංවර්ධන සැලැස්මට අනුව ඉතාමත් ඉහල මට්ටමක පිරිසිදු සෞඛ්‍ය අතින් ඉහළ මත්ස්‍ය අස්වැන්නක් ලබා දීමටත්, ධීවර කර්මාන්තයේ පුළුල් කිරීමටත් තීරණය කර ඇති බවට දැනුම් දෙන ලදී. | ලේකම්, ධීවර අමාත්‍යාංශය. |
| 30. | ලුණුගම්වෙහෙර ජලාශයේ වාන් දොරටු විවෘත කිරීම නිසා කුඩා මසුන් ජලාශයෙන් ඉවත්ව යාම. | ඒ සඳහා බැරිගේට් නෙට් එකක් යොදා ගත හැකි බවටත්, මෙයට වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව විරුද්ධ වන බවවත් කරුණු වාර්තා විය. කුඩා මසුන් ඇල්ලීම සඳහා කුඩා දැල් භාවිතා කරන බවටත්, කරුණු ඉදිරිපත් විය. | කුඩා දැල් භාවිතා කිරීමට එරෙහිව ධීවර සමිති මඟින් පොලිස් ස්ථාන වෙත දැනුවත් කිරීම් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, බැරිගේට් නෙට් යොදා ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව මේ සඳහා එකඟතාවය ලබා දෙන බව ප්‍රකාශ කරමින් පළාත් සභා වියදමින් මෙය ඉදිකරන ලෙස දැනුම් දෙන ලදී. | ලේකම්, ධීවර අමාත්‍යාංශය, දකුණු පළාත<br><br>අධ්‍යක්ෂ වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br><br>ජේෂ්ඨ පොලිස් අධිකාරි තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවී දෙපාර්තමේන්තුව |

ඉන්පසුව මහවැලි අධිකාරිය මගින් අදහස් ප්‍රකාශ කරමින් පැවසුවේ, 2026 වර්ෂයේ ධීවර ආශ්‍රිත උපකරණ මිල දී ගැනිමට හා අනෙකුත් කටයුතු සඳහා රු. මිලියන 06ක් වෙන් කර ඇති බවත්, මත්ස්‍ය ඇසිත්තන් තැන්පත් කිරිම නොමිලේ සිදු කළ බවත්, ඉදිරියේදී ධිවරයින්ගෙන් මත්ස්‍ය ඇසිත්තන් තැන්පත් කිරමේ කටයුතු වෙනුවෙන් 25%ක ආයකත්වයක් ලබා ගන්නා බවත් දැනුම් දෙන ලදී. තව දුරටත් ඉදිරියේදී මිරිදිය ධීවර කර්මාන්තය වෙනුවෙන් සහයෝගය ලබා දීමට කටයුතු කරන බවටත් ප්‍රකාශ කරන ලදී.

නැවතත්, මාස 06 කින් ඊළග කමිටු රැස්වීම පවත්වන බවත් දැනුම් දුන් අතර, මෙම රැස්වීම සාර්ථකව සංවිධානය කිරීම පිලිබඳව දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් රැස්ව සිටි සියලූ දෙනාටත් ස්තූති කරමින් ප.ව. 12.15 පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2026 ජුනි මස ..25.... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.